**ධීවර ත්‍යාග අරමුදල - 2023**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර ත්‍යාග අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ , විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලේ රු.9,968,225 ක්වූ මුදල් ශේෂය තුළ ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු ත්‍යාග මුදල් හා ඊට අදාලව රජයට ගෙවිය යුතු දායකත්වය පෙන්නුම් කරනු ලැබුව ද, රු.2,955,290 ක්වූ ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු දීමනා පමණක් ගිණුම්ගත කර තිබුණි. ඉතිරි රු.7,012,935 ක්වූ ශේෂයට අදාළව ත්‍යාගලාභීන්ට සහ රජයට ගෙවිය යුතු දායකත්ව මුදල නිශ්චිතව හඳුනාගෙන ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ධීවර ත්‍යාග අරමුදලේ මෙතෙක් නිශ්චිතව හඳුනා නොගත් ශේෂ හඳුනා ගනිමින් ඉදිරියට කටයුතු කරනු ලැබේ. මුදල් ශේෂය තුල පවතින රාජ්‍යභාගය මූල්‍ය තත්ව ප්‍රකාශය තුල ගෙවිය යුතු ලෙස වෙනමම ගිණුම් තැබීමට සටහන් කර ගන්නා ලදී. | ත්‍යාගලාභීන්ට සහ රජයට ගෙවිය යුතු දායකත්ව මුදල නිශ්චිතව හඳුනාගෙන ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| නඩු භාණ්ඩ විකිණීමෙන් ලබන මුදල | 580,187 | 375,740 | 204,447 | වාර්තා නිවැරදිව පිළියෙල කිරීමට උපදෙස් ලබා දී ඇත. | ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සසඳා නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රු.9,600,080 ක්වූ ධීවර ත්‍යාග අරමුදල සහ රු.2,955,290 ක්වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනාවල එකතුව රු.12,555,370 ක් වුවද අරමුදල් ගිණුමේ මුදල් ශේෂය රු.9,968,225 ක් වුයෙන් රු.2,587,145 ක වෙනසක් පැවතුණි. | වෙනසක් නිරීක්ෂණය වී ඇත. ඒ අනුව නිලධාරීන්ට ගෙවිය යුතු නිවැරදි මූල්‍ය වටිනාකම් හඳුනාගත් පසු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | නිලධාරීන්ට ගෙවිය යුතු නිවැරදි මූල්‍ය වටිනාකම් හඳුනාගත යුතුය. |

### 1.6.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(2) වගන්තිය | (අ) | ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | වාර්ෂිකව දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී ධීවර ත්‍යාග අරමුදලේ කාර්යන් හඳුනාගෙන ඒවා ඵලදායි ලෙස ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ඇත. | පනතට පටහැනිව සිදුකරන නීති විරෝධි ධීවර කටයුතු සම්බන්ධව වැටලීම් සිදුකිරීම වැඩි කිරීමට හා නඩු පැවරීම කටයුතු සඳහා සැලසුම් සකස් කළ යුතුය. |
| | (ආ) | 2015, 2016, 2017, 2018, 2019, 2020, 2021, 2022 හා 2023 වර්ෂවල වැටලීම් කටයුතු සිදුකර පිළිවෙලින් නඩු 348, 488, 427, 327, 604, 536 ,692 ,293 හා 719ක් ගොනුකර තිබුණි. එසේ වුවත් 2017,2018 හා 2020 වර්ෂවල දී වැටලීම් කළ නිලධාරීන්ට කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණු අතර 2023 වර්ෂය තුල ගොනුකල නඩු 719 න් | තොරතුරු ලබා ගෙන කඩිනමින් දීමනා ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

නඩු 03 කට අදාලව වැටලීම් කළ නිලධාරීන්ට ගෙවා තිබූ ත්‍යාග මුදල රු.250,165 ක් විය. පසුගිය වර්ෂයන්ට අදාළ ගෙවිය යුතු රු. 9,848,765ක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාගලාභීන්ට ගෙවා නොතිබුණි.මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදුනොවන බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.372,570 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,637,671 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,265,101 ක අඩුවීමක් පැවතුණි. මෙම අඩුවීමට රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රාජසන්තක කළ මසුන් අලෙවි ආදායම රු.2,749,153 ක් වූ අතර මින් පසුගිය වර්ෂයන්ට අදාළව හිඟ මුදල රු.1,839,060ක් විය. 2023 වර්ෂය වෙනුවෙන් රාජසන්තක කළ මසුන් විකිණීමෙන් රු.580,187 ක් පමණක් ත්‍යාග අරමුදලට ලැබී තිබුණු අතර පසුගිය වර්ෂයන්ට අදාළව කිසිදු හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය තුල ලැබී නොතිබුණි. මේ අනුව අරමුදලේ හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි. | මෙම ලැබිය යුතු හිඟ ආදායම් ලබාගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් එකතු කරගැනීම කාල පමාවකින් තොරව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂය තුල සියලුම දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා නඩු 719 ක් පවරා තිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල 04කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් ආදායම් ත්‍යාග අරමුදලට බැර වී තිබුණු නමුත් අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල කිසිවකින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අවධානය යොමු කළ බවක් අනාවරණය නොවීය. | ධීවර ත්‍යාග අරමුදලට බැරකළ හැකි මුදල් ඇත්නම් ඒවා නැවත ලබාගෙන වැටලීම් හා අධිකරණ කටයුතුවලට සම්බන්ධ නිලධාරීන්ට දිරි දීමනා ලබාගැනීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලිපි නිකුත් කර ඇත. | නඩු අවසන් වූ පසු රාජසන්තක භාණ්ඩ විකිණීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | නිම වූ නඩුවලට අදාලව උසාවිවල තැන්පත් කරන ලද මුදල් දිස්ත්‍රික් ධීවර කාර්යාල දැනුවත් කර එම ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා සියලුම දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු විසින් එම දැනුවත් කිරීම කර ඇත. | නඩුවලට අදාළ තැන්පත් මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් නීති විරෝධි කටයුතු සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීමට නියමිත ඇස්තමේන්තු පිළියෙල කර එම ඉලක්ක ළඟාකරගැනීමට ක්‍රියාකළ යුතු වුවත් අරමුදල විසින් එම ඇස්තමේන්තු පිළියෙල කර අදාළ ඉලක්කයන් ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | දිස්ත්‍රික් ධීවර කාර්යාල මට්ටමින් වැටලීම් හා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සංවර්ධන අංශයෙන් සිදු කරනු ලැබේ. එබැවින් සියළුම දිස්ත්‍රික් කාර්යාල වල නීති විරෝධී ධීවර කටයුතු වාර්තාවන ප්‍රදේශවල එම නීති විරෝධී කටයුතු මැඩ පැවැත්වීම සඳහා වැටලීම් සංවිධානය කර නඩු පැවරීම් කටයුතු සිදු කරන ලෙසට එම දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වරුන් වෙත දැනුම් දීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නීති විරෝධි ධීවර කටයුතු සම්බන්ධව වැටලීම් සිදුකිරීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කර ඉලක්ක ලඟා කරගත යුතුය. |
| (ඉ) | නීති විරෝධි ධීවර කටයුතු සිදුවන විට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලබන අවස්ථා ද, ඔත්තු ලැබීම් හරහා මෙහෙයුම් කටයුතු සිදුකරන නිලධාරීන් ද දිස්ත්‍රික් ධීවර කාර්යාලවල සෝදිසි මෙහෙයුම් කරන නිලධාරීන් ද ලේඛන ගත කළ යුතු විය. එම ත්‍යාගලාභීන් හඳුනාගත හැකිවන ආකාරයට ලේඛනගත කර කඩිනමින් ගෙවීම් කල යුතු වුවත් එවැනි ලේඛනගත කිරීමක් සිදුකර නොතිබූ අතර මෙම ත්‍යාගයන් පිළිබඳ මහජනතාව දැනුවත් කර නීති විරෝධි වැටලීම් වැඩිකර ගැනීමට කළමනාකරණය ක්‍රියාකර නොතිබුණි. තව ද 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(1) වගන්තිය යටතේ මෙම අරමුදල පිහිටුවා ඇත්තේ නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණෙන් වුවද එම අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි. | ලේඛනයක් පවත්වාගෙන යන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | වැටලීම්වලට අදාළ සියලු විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |

**3.2** වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයට පෙර වර්ෂවල සිට ක්‍රියාත්මක වන නඩු පිළිබඳ විස්තර ද කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ නීති අංශයෙන් අදාළ නඩු පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා පෙර වර්ෂවල සිට ක්‍රියාත්මක වන නඩු හා නිමවූ නඩු පිළිබඳ පැහැදිලි අවබෝධයක් විගණනයට ලබාගත නොහැකි වුණු අතර එම විස්තර නිසි පරිදි පවත්වාගෙන නොයන බැවින් කාර්යසාධනය සැසඳීමක් කළ නොහැකි විය. | වර්තමානයේ google sheet හරහා දත්ත ලබාගන්නා බැවින් 2024 කාර්යසාධන වාර්තාවට ක්‍රියාත්මක කරනු ලබන සියලු නඩු ඇතුළත් කරන බව තවදුරටත් දැනුම් දෙමි. | නඩු පිළිබඳ සියලු විස්තර කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් පවරා තිබු නඩු, ක්‍රියාත්මක නඩු, ඒ ඒ කාර්යාලවල අත්අඩංගුවේ පවතින භාණ්ඩ, අධිකරණවල පවතින නඩු, අවසන් වූ නඩුවලින් ත්‍යාග අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ තොරතුරු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා, ධීවර ත්‍යාග අරමුදලේ කාර්යසාධන වාර්තාව මඟින් නිවැරදි තොරතුරු හෙළිදරව් නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය. | නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් වලින් සහ නඩු පැවරීම් මඟින් අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ විස්තර කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට උපදෙස් දෙන ලදී. | අධිකරණවල පවතින නඩු සහ නඩුවලින් ත්‍යාග අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ සියලුම විස්තර කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතුය. |